# කරුණාවන්ත සුරංගනාවිය




හයන්ෂා ගයින්දි නවරත්න

2 බී ශ්‍රේණිය

මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

කෘතියේ නම - කරුණාවන්ත සුරංගනාවිය

ප්‍රථම මුද්‍රණය - 2025-01-15

කතාව හා චිත්‍ර - හයන්ෂා ගයින්දි නවරත්න

කතෘගේ ලිපිනය - 69/3 ,නාපාන,මැණික්හින්න

පාසල - මහාමායා බාලිකා විදුහල

ශ්‍රේණිය - 2 ශ්‍රේණිය B



CamScanner

# පිදුම

මා ආදරණීය අම්මි හා අප්පච්චි ට

හා

තමිලා කරුණාරත්න ගුරුමැණියන්ට



CamScanner

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# ස්තුතිය

කරුණාවන්ත සුරංගනාවිය නැමති කතාන්දර පොත නිර්මාණය කිරිමට මහ පෙන්වු මාගේ පන්තිභාර ගුරුතුමිය වන 2-බි ශ්‍රේණියේ තමිලා කරුණාරත්න ගුරු මැණියන්ටත්,

මාගේ ආදර අම්මි හා අප්පච්චිටත් , අයියා හා අක්කිටත් නන් අයුරින් උදව් කල සොනාලි නැන්දටත් මාගේ හදපිරි ස්තුතිය පුදකරමි.

හයන්ෂා ගයින්දි නවරත්න,

2-බි ශ්‍රේණිය,

මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.



CamScanner

එකමත් එක කාලේක ලස්සන සුරංගනාවියක් සිටියා.



CamScanner

මේ සුරංගනාවිය හරිම
හොඳයි. ඒ වගේම
ළමයින්ට හරිම ආදරෙයි.



CamScanner



දවසක් මේ සුරංගනාවිය
මල් වත්තක ඇවිදින්න
ගියා.



CamScanner

මේ සුරංගනාවිය මල්
වත්තට යන අතරතුර කුඩා
ළමයෙක් අඬ අඬ ඉන්නවා
දැක්කා.



CamScanner



ඉතින් මේ සුරංගනාවියට
දුක හිතිලා ළමයා ළඟට
ගියා.



CS CamScanner

"ඇයි බබා ඔය අඬන්නේ"
කියලා සුරංගනාවිය
ඇසුවා.



CamScanner

අනේ සුරංගනාවිය මම මෙතන වැටුණා. "මගේ කකුල තුවාල වුණා. මට ඇවිදින්න බෑ. ඒකයි මම අඬන්නේ."



CamScanner



සුරංගනාවියට දුක හිතුණා.
ඉක්මණටම බෙහෙත්
සොයා ගෙන ළමයාගේ
කකුලට දැම්මා.



CamScanner



“දැන් ඔයා අඬන්න එපා
කකුල ඉක්මණටම සනීප
වෙයි” කියලා සුරංගනාවිය
යන්න ගියා.

ටික දවසකින්ම ළමයාගේ
කකුල සුව වුණා.



CamScanner

ළමයයි අම්මයි දෙන්නම සුරංගනාවියගේ මාලිගාවට ගියා.



CamScanner



ළමයාට කරපු උදව්වට සුරංගනාවියට ස්තූති කළා.



CamScanner



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN : 978-624-208-225-7

CamScanner